2010 දෙසැම්බර්

**20** වන කලාපය

ශ්‍රී ලංකා හේතුවාදි සංගමයේ
ප්‍රකාශනයකි
ආධාරය රුපි. 30.00

# යථාර්ථ

***YATHARTHA***

**පුවත් ලිපිය - NEWS LETTER**

---

## "තිහගොඩ ආරියවතීට සෞදි හාම්පුතා විසින් ඇන ගැසීම" ප්‍රවෘත්තිය පිළිබඳව මනෝ විද්‍යාත්මක විමසා බැලීමක් සඳහා යෝජනාවක් !

පසුගිය වකවානුවේ රටේ බලවත් අවධානයට පාත්‍ර වූ සිදුවීමකි, ඉහත කී ආරියවතීට ඇන ගැසීමේ ප්‍රවෘත්තිය. ජනමාධ්‍ය මෙන්ම සෞඛ්‍යය බලධාරීන්ද, එපමණක් නොව සමහර විට මනෝ වෛද්‍යවරුන්ද මෙම ප්‍රවෘත්තියට අදාල විවෘත මානයන්ගෙන් වන විමසා බැලීමකට නොඑළඹීම එක්තරා ආකාරයක අවාසනාවන්ත තත්වයකි. මේ අරබයා පැවති එකම කථාව, වෙනත් ආකාරයකට විමසා බැලීමකට යොමුවූයේ ඉතා කලාතුරකින් අයෙකි. මක්නිසාද මෙය එක්තරා ආකාරයකින් වියහැකි සිදුවීමක් වන බැවිනි.

කෙසේ මුත් මේ තත්වය නිරවුල් කරගැනීමට, නිරාකරණය කරගැනීමට සලකා බැලියයුතු මූලික හා වැදගත් කාරනා කිහිපයක්ම අදාල පාර්ශවයන් විසින් අවධානයට පාත්‍රකොට නොමැති බව නම් නිශ්චිත වශයෙන්ම ප්‍රකාශ කල හැකිය.

සමාජය තුල මතුවන ආන්දෝලනාත්මක සිදුවීම්, සංවේදි සමාජ ප්‍රපංචයන් වඩාත් විමර්ශනාත්මකව දකින්නට උත්සාහ කිරීම අපවැනි සංවිධානයක වගකීමක් කොට සලකමු.

ඒ අනුව මෙම ප්‍රවෘත්තියට අදාලව වඩාත් නිවැරදි තීන්දුවකට එළැඹීමට අවශ්‍ය අර්ථවත් සාකච්ඡාවක් මතුකර ගැනීම හා මෙවැනි සිදුවීම් හා සමාන්තර අත්දැකීම් හා දැනුම බෙදා ගැනීම අපගේ ප්‍රවේශයේ උවමනාවයි.

මෙහිදී අවධානයට පාත්‍රවිය යුතු පසුබිම් තත්වයන්ද, මනෝ විද්‍යාත්මක පැතිකඩයන්ද පාදා ගැනීමට අදාල සාක්ෂි කිහිපයක් පහත දක්වා සිටිනුයේ ඒවා යලි  අවධාරනය කිරීමට තරම් වැදගත් යැයි හැඟෙන බැවිනි.

අනෙක් අතට මෙකී සිදුවීම පහත පරිදි අප විසින් අනුමාන කරනු ලබන මානසික විග්‍රහයක ප්‍රතිඵලයක් අනුව වෙයි නම් ඉදිරියේදී එය තවත් එවැනි අයට ප්‍රේරණය වීමටද ඉඩ ඇති බව අපට ඇති වැටහීමයි.

**ඒ අනුව අපගේ අවධාරණයන් මෙලෙස පෙලගස්වමු.**

i. ආරියවති මහත්මියගේ ශරීරය තුළ වූ ඇන ඇතුළු කොට තිබුනේ හමට සමාන්තරව වීම (එනම් පේෂි තුලට හෝ මස තුළට කිඳා බස්සවා නොතිබීම)

ii. යම් කෙනෙකුට පහසුවෙන් තමන්ගේ ශරීරය තුළ අත පෙවිය හැකි ස්ථාන ආශ්‍රිතව පමණක් මෙම ඇන ඇතුළු කොට තිබීම. එනම් ඇයව වඩාත් පීඩාවට ලක් කිරීමට උවමනාවෙන් මෙලෙස ඇන ඇතුළු කිරීමක් සිදුකළේ නම් පිට ප්‍රදේශය, ලිංගාශ්‍රිත ප්‍රදේශය, පසු ප්‍රදේශය වැනි (පර පීඩික කාමයෙන් පෙලෙන්නෙකු යොමුවිය හැකි) ප්‍රදේශ වල එලෙස ඇන ඇතුල් කර තිබිය යුතුය.

iii. ඇය ජීවත් වූ සමාජ පරිසරයත්, පවුල් පරිසරයත්, ඇයගේ ප්‍රජානන හැකියාවත් ආදි කරුණු සලකා බැලුනු විට මෙරටින් නික්ම් සෞදි හාම්පුතාගේ මන්දිරය තුළ ඇය දැඩි ආත්මීය හුදෙකලාවකට හා සංස්කෘතික හුදෙකලාවකට ලක්වීමට යම් සම්භාවිතාවක් තිබීම. එනයින් ඉන් මිදීමට **අවිඥානිකවම** පුද්ගලයෙකු මෙවැනි උපායන් ඇනවුම් කර ගැනීමට ඇති හැකියාව. (උදා: පාසැල් යාම අප්‍රිය කරන කුඩා ළමුන් හට කායික හේතුවක් නොමැතිවම වුව බඩේ අමාරුවක් හෝ වෙනත් එවැනි රෝගී තත්වයක් හට ගැනීමට හේතුවද මෙවැනි අවිඥානික ක්‍රියාවකි)

iv. තමාට ඇන ගැසීම පිළිබඳව ඇය කිසිදු බලධාරියෙකුට හෝ අවම වශයෙන් තම පවුලේ සාමාජිකයෙකුට හෝ නොපවසා වෛද්‍යවරයා වෙත ගොස් මෙම ඇන ඉවත් කරදෙන මෙන් ඉල්ලා ඇති අතර පවුලේ සාමාජිකයන් පවා මෙවැනි කථාවක් දැන ගත්තේ ජනමාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වන විටයි.

v. මෙම සිදුවීම සත්‍යයක් නම් බලවත් වන්දියක් ලබා ගැනීමට පහසුවෙන් ම ඉඩ තිබෙන මුත් එවැනි නීතිමය ක්‍රියාමාර්ගයකට එළඹීමට ඇගේ ඇති නොකැමැත්ත

vi. අදාල සෞදි හාම්පුතා විසින් අරියවති හට නියමිත පරිදි වැටුප් හා ආහාර ඇතුළු අවශ්‍යතා නොඅඩුව සපයා ඇති බවට ඇය විසින් ප්‍රකාශ කිරීම. එමෙන්ම ඇය විසින් ප්‍රකාශ කොට ඇති තොරතුරු අනුව සෞදි හාම්පුතා ඇතුළු පවුලේ සාමාජිකයන් ඇයට වෙනත් අකාරුණික සැලකීමක් සිදුකොට නොතිබීම. එපමණක් නොව ආරියවති මහතත්මිය ඔවුන් කෙරේ වෛරයකින් නොපසුවීම

මෙය යම් මානසික තත්වයක් හේතුවෙන් ඇය විසින්ම (එහෙත් අවිඥානිකව) කරගත් යමක් නම් එවැනි ආකාරයේ පළමු අත්දැකීම මෙය නොවන බව අපි ප්‍රකාශ කර සිටිමු. මක්නිසාද මෙලෙස වාර්ථා වූ තවත් අවස්ථා ලංකාවේ මනෝ වෛද්‍ය විද්‍යා ඉතිහාසයේ ලියැවී ඇති බැවිනි.

කෙසේ වුවත් අප ඉදිරිපත් කරන අනුමානය හෝ සැකය සත්‍යයක් වුවත් එවැන්නක් ඇය සවිඥානිකව, සැලසුම් කොට සිදුකල ක්‍රියාවක් නොවනු ඇත. විදේශගත වීම හේතුවෙන් ඇතිවූ සංස්කෘතික දුරස්තකරණයත්, පවුල් සබඳතා වලින් හුදෙකලා වීමත් නිසා සෞදි හාම්පපුතාගේ ආගන්තුක පරිසරයෙන් පලායාම ට අවිඥානිකව ම ඇය විසින් සිදුකරගත් අහිංසක ක්‍රියාවක් විය හැකිද යන්න විමසා බලා නිගමනය කිරීම මනෝ වෛද්‍ය විශේෂඥයින්ගේ කාර්යයක් විය යුතුය.

තවද අහිංසක කාන්තාවක් වන ඇයට අගතියක් සිදුනොවිය යුතු වගද, මේ සමස්ත සිදුවීම අපගේ අනුමානය බව ප්‍රත්‍යක්ෂ වුවහොත් ඉන් හඟවනුයේද මානුෂිය සබඳතා අවහිර වීම නිසා මතු වූ මානුෂිය කාරණාවක් වන බවද අප තේරුම් ගත යුතුව ඇත.

**තාරක වරාපිටිය**

## කලාව හා හේතුවාදය

කලාව යනු සෞන්දර්යාත්මක වින්දනයකි. විවිධ දැනුම් මට්ටම් විවිධ ජීවන අත්දැකීම්, සමාජ අත්දැකීම් එමෙන්ම කලා සෞන්දර්යාත්මක ශික්ෂණයන්ට සාපේක්ෂව විශාල පරාසයක වූ කලාවන් අප වින්දනය කරයි. එසේ නැත්නම් සෙසු සමාජය වෙනුවෙන් එවැනි කලාවන් නිෂ්පාදනය කරයි. කලාව(කලා කෘති) නිෂ්පාදනය තුලින් හෝ කලාව විඳීම තුළින් මානුෂිය කම්පනයක් අපි ලබමු. කලාව විවිධ විෂයයන්, ධාරාවන් ඔස්සේ විහිදී-පැතිරී ඇති මහා සංදර්භයකි. මිනිසාගේ භෞතික ජීවිතය විශාල වනවාත් සමග අළුත් කලාවන් බිහිවී වර්ධනය වේ. එමෙන්ම මිනිසාගේ (සමාජයේ) පරිකල්පනය දියුණු වනවාත් සමග මේ කලාවන් ගුණාත්මකව ඉහළ මට්ටම් (අවධි) වලට එසැවේ.

**හේතුවාදියෙකුට, වඩාත් නිවැරදිව කියනවානම් අප වැනි අනුභූතික හේතුවාදියෙකුට කලාව යන්න අදාල වන්නේ කෙලෙසින්ද?**

**හේතුවාදියෙකු ලංකාවේ අද පවතින සංදර්භය තුල කලාව කෙරෙහි අප මැදිහත් වන්නේ කෙලෙසින්ද?**

අප බොහෝ දෙනෙකු එකඟ වන පදනම් කාරණාවක් වන්නේ විවිධ සමාජ කාරණාවන්ට අදාලව මිත්‍යාව අද බෙහෙවින් පැතිරී ඇතිය යන්න. එය එසේ වේ නම් ඉන් කියවෙන්නේ අද දවසේ සමාජ-සංස්කෘතික කාරණාවන් අරබයා සමාජයේ සාතිශය බහුතරය ඉතා මුග්ධ ආකාරයෙන් තේරුම් ගනිමින් තිබෙන බවය.(මක්නිසාද කලාව යනු රටක සමාජ-සංස්කෘතික නිරෝගී භාවයේ ප්‍රකාශනයක් වන නිසායි).

එකී තත්වය හේතුවෙන් අද අපේ රටේ කලාවේ වර්ධනයට හා එහි අළුත් මාවත් කරා ප්‍රවේශ වීමට බාධා පමුණුවන සංරචකයන් පළමුව හඳුනාගත යුතු වෙයි.

මේ මොහොතේ අපේ රට (රාජ්‍ය) තුල බලවත් ආයතන හා පුද්ගලයන් විසින් කලාව කොරහි පනවනු ලබන තහංචි විසින් එකී ආයතන හා පුද්ගලයන්ගේ පරිකල්පනයේ, විචාර බුද්ධියේ දරිද්‍රතාවය ප්‍රදර්ශනය කොට ඇත. ඒ අනුව මෙවැනි පසුගාමී පරිකල්පන යක් සහිත සමාජ ආයතන පද්ධතියක් අතික්‍රමණය කරමින් දියුණු කලාවක් සඳහා වන එවැනිම එක්තරා

අරගලයක් ඇති බව අප තේරුම් ගත යුතුවූ ඇත.

ජාතිය,ආගම දේශප්‍රේමය ආදිය පරම (උත්තම) වී ඇති වකවාණුවක ඒවා කෙරෙහි අති අනභිබවනීය විශ්වාසය අභියෝග කරන්නාවූ, ප්‍රශ්න කරන්නාවූ කලා කෘතියකට ඉඩක් අද නැත. එව මෑත කාලයේ යථාර්තයක් වූ ආකාරය අපි අත්විඳිමින් සිටිමු. බටහිර ලිබරල් සමාජය තුළ එවැනි සීමාවන් නොමැති අතර ආගම, ජාතිය,ආගමික නායකයින් දේශපාලන නායකයින් අනභිබවනීය ලෙස නොසලකා කරනු ලබන නිදහස් කෘතීන් පිළිබඳව අපි අසමු. ආන්දෝලනාත්මක, විවාද සම්පන්න කෘතීන් කෙරෙහි වුව ශිෂ්ඨ සම්පන්න ආකාරයෙන් විඳ දරාගන්නා සංස්කෘතියක් එහි වෙයි.

ආගමික තහංචි හෝ සදාචාරාත්මක තහංචි විසින් යම් සමාජයක කලාව ඇතුළු ජීවිතයේ සංරචකයන් සීමා කිරීම හෝ අහුරා දැමීම විසින් කියාපාන්නේ එම සමාජයේ පසුගාමිත්වයේ තරමයි. එනම් එම සමාජය ගතානුගතිකත්වයෙන් නිදහස් වීමට තව කෙතරම් දුරක් තරනය කලයුතු වේද යන දර්ශකයයි. එසේත් නැත්නම් විචාරශීලි බුද්ධියට, විමර්ශනාත්මක චින්තනයට එම සමාජය තුළ කෙතරම් අවකාශයක් පවතිද යන මිම්මයි.

ඒ අනුව ආගම, සදාචාරය,රාජ්‍යයේ බලාධිකාරි ආයතන ආදිය පදනම් කොට ගෙන (ඒවා පරම දේවල් යැයි සලකා) කලා කෘතීන් කෙරෙහි පනවන්නාවූ තහංචි වලට එරෙහි අරගලයක් හේතුවාදි ක්‍රියාකාරීත්වය තුළ අඩංගු වනු ඇත.

රාජ්‍යයේ බලාධිකාරි ආයතන විසින් පනවන් තහංචි හා සීමාවන්ට අවනතව බිහිවන කලා කෘති විසින් සමාජ පරිකල්පනය තියුණු කිරීමට, අවදි කිරීමට, උසස් මානුෂීය තලයක සෞන්දර්යාත්මක වින්දනයක් ලැබීමට විභවයක් නොතනයි.

**විශ්වනාත් තේනුවර**

## අධිමානසික බලය හා පුනරුත්පත්තිය

වෙනත් පුද්ගලයන් මෙන් නොව සත්‍ය ගවේශණය කරන්නෙකු වූ මා මිත්‍ර ඒ ඕ ආර් ප්‍රනාන්දු ' මහතා පුනරුත්පත්තිය හා අධිමානසික බලයෙන් ද්‍රව්‍යයන් චලනය කිරීමට ඇති හැකියාව පිළිබඳ ව තරයේ විශ්වාස කරයි. ඔහුගේ විශ්වාසයන් තහවුරු කිරීමට කරුණු කාරණා අටවන ප්‍රනාන්දු මහතා හේතුවාදීන්ට ද අභියෝග කරයි.

### අනුභූතිවාදියෝ

හේතුවාදිහු සත්‍ය දකින්නෝ වෙත්. සමාජයේ බෙහොමයක් හේතුවාදීන්ට වඩා අනුභූතිවාදිහු වෙත්. හේතුවාදිහු දිර්ඝ ගවේශණයකින් පසුව පමණක් සිය දැනුම තහවුරු කර ගනියි. අනුභූතිවාදිහු සිය

දැනුම පංචේන්ද්‍රියයන් මගින් පමණක් ග්‍රහණය කැ ගැන්මට සමත් වෙතැයි සිතත්. මුලින් අනුභූතිකව පමණක් අප ඉදිරියෙන් වූ අහස් යානා රූපවාහිනී යන්ත්‍ර, පරිගණකය, හද ගැස්ම පවත්වා ගෙන යන යන්ත්‍ර විද්‍යාඥයන් විසින් සොයාගනු ලැබුනි. නූතන තාරකා විද්‍යාව සූර්ය ග්‍රහන අවස්ථාවක අවට අඳුරු වන්නේ ඇයිද යන්න පමණක් නොව ඊට පසු සිදුවන දෑ පිළිබඳවද අනාවැකි ඉදිරිපත් කරත්. නමුත් නූතන හේතුවාදීන් පිළිගනු ලබන්නේ අනුභූතිවාදීන් ගෙනෙන උපමානයන් සෑම ආකාරයෙන්ම විග්‍රහයට බඳුන් කිරීමෙන් පසුවයි.

**මූලිකදේ**

මූලික ප්‍රශ්න තුනක් ඉදිරිපත් කිරීමට පෙරාතුව මගේ නිල නොවන මහේස්ත්‍රාත් නීතිවේදී මිත්‍රයාට නීතිමය සාක්ෂි වලට වඩා විද්‍යාත්මක සාක්ෂි වඩා ප්‍රබල බව සඳහන් කිරීමට කැමැත්තෙමි.නීති ක්ෂේත්‍රයේ අතිශය ගෞරවාදරයට පත් වූ ඊ ආර් එස් ආර් කුමාරස්වාමි මහතාද විද්‍යාත්මක සාක්ෂි වඩා ප්‍රබල බව සඳහන් කරයි. මගේ නිසැක කල්පනාව ට අනුව එල්ලා මැරීම අවලංගු කිරීමට බෙහෙවින් බලපාන ලද්දේ විද්‍යාත්මක නොවන ස්වභාවයයි. නීතිමය සාක්ෂි යටතේ නිර්දෝෂී අහිංසකයන්ද එල්ලා මරනු ලැබුණි.

**පෙර පිළිතුරු**

ඒ ඕ ඒ ආර් ප්‍රනාන්දු මහතා හේතුවාදීන් වෙත ඉදිරිපත් කල ප්‍රශ්න ත්‍රිත්වයට හේතුවාදී සංගමයේ සභාපති ධර්මපාල සේනාරත්න මහතා විසින් පෙබරවාරි **ද අයිලන්ඩ්** පුවත්පත මගින් පිළිතුරු සැපයිණි. නමුත් එම ප්‍රශ්නයන්ට වෙනත් මානයකින් පිළිතුරු සැපයීමට කල්පනා කලෙමි.

**වැරදි දැක්ම**

ඒ ඕ ඒ ආර් ගේ පළමු ප්‍රශ්ණය වන්නේ ජනාධිපති බුෂ් ස්නයිපර් ප්‍රහාරයකින් 1992 සැප්තැම්බර් 17 වෙනි දින ඇමෙරිකාවේ ඔකලොහොමා නුවරදී ඝාතනය වීමයි. මෙම ප්‍රශ්ණයට පිළිතුරු සැපයීමේදී මම මදක් මාතෘකාවෙන් බැහැරට යාමට කල්පනා කරමි. තාරකා විද්‍යාඥයන් සූර්ය ග්‍රහනයන් පිළිබඳව නිගමනයන්ට පැමිනෙන්නේ ග්‍රහලෝක වල භ්‍රමනය පිළිබඳ කෙප්ලර්ගේ සොයාගැනීම් උපයෝගී කරගෙනයි. එය නොවෙනස්ව සිදු වෙයි. ලොවෙහි සෑම දෙයක්ම අවශ්‍යතාවයන් අනුව සිදුවෙයි.

ලොව සියල්ලම එකම දම්වැලක පුරුක් මෙන් හේතුඵලවාදීව සිදු වන්නේය. ජුලියස් සීසර් ඝාතනය පෙර අනාවැකියකට අනුව සිදුවීද? ජුලියස් සීසර් නාටකයෙහි පළමු කොටසේ පළමු දර්ශනයේදී ශාස්ත්‍රකරුවෙක් “මාර්තු 15 වෙනිදින පරිස්සම් වන්න” යැයි කියයි. සීසර් එය නොතකා හරියි. දින කිහිපයකට පසු තුන්වන කොටසේ පළමු දර්ශනයෙන් අගනුවරට යමින් සිටි සීසර්ට ශාස්ත්‍රකරු හමුවෙයි. අද මාර්තු 15 වෙනිදින බවත් නොයන ලෙසත් ශාස්ත්‍රකරු සීසර්ට කියයි. සීසර් අවඥාවෙන් ශාස්ත්‍රකරු දෙසබලා පෙරට යයි. දිනය නිමා වන්නට මත්තෙන් සීසර් ඝාතනය කරනු ලබයි. ශාස්ත්‍රකරු අනාගත දැක්මේ ත්‍යාගය ලබයි.

## ඉක්මනින් පැහැදිම

ප්‍රනාන්දු මහතා ඉදිරිපත් කරන ඊලඟ කාරණය ස්වභාවික හේතුන් යටතේ සිදු නොවුනු බුෂ් මහතාගේ මරණයයි. නීතිඥ ඒ ඕ ඒ ආර් ප්‍රනාන්දු මහතා මහේස්ත්‍රාත් වරයා වෙත කියා සිටින්නේ ශාස්ත්‍රකරු ජනාධිපති රහස් තොරතුරු සේවාවට දැනුම් දුන්නේ නම් ජනාධිපති බුෂ් මරණයෙන් ගලවාගත හැකිව තිබූ බවයි. නමුත් සිදුවනදේ සිදුවිය යුතුය. ඇත්තෙන්ම බුෂ්ගේ මරනය පිළිබඳව නිගමනයන් ශාස්ත්‍රකරු තුළ නැත. ජුලියස් සීසර් නාටකයෙහි අනාවැකි සියල්ල සිදුවූවාට පසුවය. ධර්මපාල සේනාරත්නයන් ශාස්ත්‍රකරුවන්ගේ කීම් තරව ගැන්ම පිළිබඳව ප්‍රනාන්දු මහතා කෙතරම් නම් නෝන්ජල් වී ඇත්දැයි විමසයි. ප්‍රනාන්දු මහතා බුෂ් මහතාගේ මරණය පිළිබඳ අනාවැකිය පිළිබඳ ලිඛිත සටහන මා වෙත තැපැල් කර එවා ඇත. අනාවැකි පැවසූ ශාස්ත්‍රකරුගේ ප්‍රකාශය ලබාගත් පුද්ගලයා නමින් පෙනී නොසිටියි. තමන් කව්දැයි හඳුන්වා නොදෙන රහස් පරීක්ෂකවරයා අනාවැකි පවසන්නාගේ හවුල්කරු විය හැක. ශාස්ත්‍රකරු නැවත තම ප්‍රබන්ධය ජනාධිපති රහස් අංශයට දීමෙන් විශාල ත්‍යාගයක් ලබා ගන්නටත් ඇත. කණගාටුවට කරුණ නම් මා මිත්‍ර ප්‍රනාන්දු මහතා මෙම ප්‍රවෘත්තිය එහෙම පිටින්ම ගිල දැම්මයි.

## දරුවාගේ "ජයවේවා"

ප්‍රනාන්දු මහතා ඊලඟට ප්‍රතාපවත්, ජනහිතකාමී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රධාන සාක්ෂිකරු ලෙස කැඳවා ගනිමින් හේතුවාදින් වෙත තවත් අභියෝගයක් ඉදිරිපත් කරයි. කියවෙන කථාවට අනුව අටමස් වියැති බිළිඳා තම මුවින් දෙඩූ පළමු වදන ලෙස "ජයවේවා" යි සුභ පැතුවේ මැතිවරන රැස්වීමක, වේදිකාවක දරුවා ඉහළට ඔසවා හුරතල් කරන විටය. ප්‍රනාන්දු මහතාගේ අදහසට අනුව පෙර ආත්මයේ ළදරුවාගේ දේශපාලන වීරයා මේ ආත්මයේදී ද වේදිකාව මතදී නිනවු වී දැන හැඳින ජයවේවා යි පැතූ බවයි. පුනරුත්පත්තිය නැමති අසම්භාවිතාවයට කදිම උදාහරණයක් යයිද ඊට එරෙහිව කරුණු ඇතොත් ඉදිරිපත් කරන ලෙසද හෙතෙම අභියෝග කරයි.

## විද්‍යාත්මක විග්‍රහය

චාල්ස් ඩාවින් තුමාගේ විග්‍රහයන්ට අනුව ළදරුවාගේ දෙඩවිල්ල තුළ මිනිසාට කථාකිරීමට ඇති සහජ ආශාව විද්‍යමාන වේ. න්‍යුරෝන විද්‍යාවේ මූල ධර්ම නම් වූ ග්‍රන්ථයේ දරුවකුගේ කථාබහ ගැන කරන කථා අතිප්‍රධානය. එහි 1171 වෙනි පිටුවෙහි මේ පිළිබඳව සටහන් ව ඇත. මාස 5-7 කාලවලදී භාෂාත්මක ශබ්දයන් නිපදවා පිට කරයි. 7-8 මාස වලදී හොඳින් නිමවූ ශබ්ද මුමුණයි. 1170 වෙනි පිටුවෙහි දක්වන්නේ පිටත ශබ්ද තමා තුළට ලබාගන්නා බවයි. ජනාධිපතිවරණයේ උනුසුම හිණි පෙත්තටම නැග තිබෙන විට වේදිකාව මත පෙනී සිටින ඔහුට පිළිගැන්මට ජනයා නගන එකම හඬ "ජයවේවා" යන්නයි. ඒනිසා ජනපති හුරතල් අටමස් වියැති දරුවා ඉහළට ඔසවා හුරතල් කරන විට ඔහුගේ මනසට කිඳාබැස පැවති මෙම ආශිර්වාදාත්මක වදන දරුවා විසින් මුමුණන්නට ඇත. ප්‍රනාන්දු මහතා නීති වෘත්තියට ප්‍රවිශ්ඨ වීමට ප්‍රථම රසායන විද්‍යාව උගත්තේය. එම නිසා ඔහුගේ බුද්ධිය හා අධ්‍යාපනය සැලකිල්ලට ගනිමින් ස්වභාවික ව්‍යසන පැහැදිලි කිරීමක් විනා, දරුවෙකු බිනූ තනි වදනක් අල්ලා නිතිමය තර්ක මධ්‍යයේ කරන ඔප්පු කිරීමත් අදාළ නොවෙතැයි සිතමි.

**යූරි ගෙලර්**

අපකීර්තිමත් ඊශ්‍රායල් ජාතික **යූරි ගෙලර්** ඔහු විසින් අධිමානසික බලයෙන් සිදුකරන ලද විශ්මයන් සමග හෙළිදරව් වී බොහෝ කලක් ගතවීත් ඒ පිළිබඳ නොදැන්ම ගැන මම කණගාටු වෙමි. ගෙලර් ඔහු සතු ඊනියා චිත්ත ශක්තියෙන් හැඳි නැවිය හැකි බවට පාරම්බෑවත් හැඳි කෙළවරින් යන්තමින් නොඅල්ලා සිදුකළ නොහැකි බව අනාවරනය වුනි. ගෙලර් හෙළිදරව් කරන ලද්දේ භෞතික විද්‍යාඥයෙක් නොවීම සඳහන් කළයුතු කරුණකි. ශ්‍රේෂ්ඨ මැජික් ශිල්පී **ජේම්ස් රැන්ඩි** යූරි ගෙලර් විසින් අධිමානසික බලයෙන් සිදු කරන ලදදේ යැයි කියන ලද සියලු දේ අධිමානසික නොවන විජ්ජාවන් මගින් සිදුකර ප්‍රදර්ශනය කරන ලදි. ප්‍රනාන්දු මහතා දැනගත යුත්තේ ගෙලර්ගේ අධිමානසික ශක්ති විජ්ජාවන් හා වෙනත් ප්‍රයෝගයන් හෙළිදරව් කරමින් ඩේවිඩ් මැක්ස් හා රිචර්ඩ් විසින් ලියන ලද පොත් ඇමෙරිකන් ප්‍රකාශකයින් 30 ක් විසින් ප්‍රකාශයට පත් කිරීම ප්‍රතික්ෂේප කිරීමයි. සත්‍යය නම් චිත්ත ශක්තිය ප්‍රවෘත්තියක් පමණි. දක්ෂ පුවත්පත් කරුවෝ එය දනිත්.

## මහාචාර්ය කාලෝ ෆොන්සේකා

ප්‍රධාන කතෘල

දිවයින

## <u>2010-12-16 :බ්‍රහස්පතින්දා- දින දිවයින පුවත්පතේ පිටු දෙකක පල කර තිබූ “පිළිකාවට තිත” නම් දැන්වීම සම්බන්ධවයි.</u>

මීට කලකට පෙර, පංච මහා විශ්ව බල ශක්තියෙන් සියළුම ආකාරයේ ලෙඩ රෝග සුවකර දෙන්නෙමැයි ද එමෙන්ම සියළු අපේක්ෂාවන්, ප්‍රාර්ථනාවන් ඉටු කර දෙන්නේමැයිද ප්‍රකාශ කළ ( පුවත්පත් වල විශාල දැන්වීම් පල කළ) ඩී. එන්. දළුවත්ත නම් වංචනිකයා පිළිබඳව අපේ සමාජයට මේ වන විට අමතකව ගොස් තිබෙනවා විය හැකිය.

මොහුගේ රැවටිලිකාර ව්‍යාපාරයට පසුබෑමක් ඇති වූයේ පසුගිය දකුණු පලාත් සභා ඡන්දය වකවානුවේ සිදු කළ මහා පුරසාරමක් අතේ පත්තු වීම නිසාය.

එම පලාත් සභා ඡන්දයේදී මාතර දිස්ත්‍රික්කයෙන් තරඟ කළ මොහු ඡන්දයට පෙරාතුව පාරම් බෑවේ, මාතර දිස්ත්‍රික්කයෙන් හැර අනෙක් දිස්ත්‍රික්ක දෙකෙන් තරඟ කරන්නෙකු තමාට රුපියල් දශලක්ෂයක ගාස්තුවක් ගෙවීමට ඉදිරිපත් වන්නේනම් දිස්ත්‍රික්කයේ පලමු තැනට වැඩිම මනාප ලබා ගත හැකි බලවත් වශියක් කර දිය හැකි බවයි.

(තමන් අනිවාර්යයෙන්ම මාතර දිස්ත්‍රික්කයෙන් වැඩිම මනාප ලබා ගන්නා හෙයින් මාතර දිස්ත්‍රික්කයේ කිසිවෙකුට ඒ අවස්ථාව (වශිය) ලබා දිය නොහැකි බවද එහිදී ප්‍රකාශ කොට තිබුණි. )

නමුත් කවුරුත් දන්නා පරිදි ඔහුට එම ඡන්දයේදී දිස්ත්‍රික්කයෙන් වැඩිම මනාප ලබා ගැනීම තබා මන්ත්‍රී වරයකු ලෙස තේරී පත් වීමට පවා නොහැකි වුණි.

දැන් මෙම වංචනිකයා යලිත් වතාවක් තම මගඩි ව්‍යාපාරය අළුත් තේමාවක් සහිතව ආරම්භ කොට ඇත්තේ " පිළිකාවට තිත " තබමින් සියයට සියයකින්ම පිළිකාව සුව කරන්නා වූ අපූරු උපකරණයක්ද හඳුන්වා දෙමිනි.

ලංකාව මේ වන විට ඕනෑම තක්කඩියෙකුට, ඕනෑම මගඩියක් සිදු කළ හැකි "විනය ගරුක " "ආගමික", "දේශහිතෛශී", "සදාචාරවත්" තෝතැන්නක් බවට පත්ව ඇති වග "අන්තර්ඥානයෙන්" වටහා ගත් දළුවත්ත වැන්නන් තම ව්‍යාපෘති (අළුත් වටයකින්) ආරම්භ කොට ඇත. මේ සමාජ විරෝධී බොරුකාරයාගේ මුදලට යට වී එකී සදාචාර විරෝධී දැන්වීම පල කරමින් මහජනයා / පාඨකයා හා රෝගීන්ද මුලාවේ දැමීමට අනුබල දීමේ කටයුත්තට **දිවයින** පුවත්පතද මෙහිදී හවුල් වී ඇති බව අපගේ නිගමනයයි. මෙවැනි ආචාරධාර්මික වරදක් ජන මාධ්‍ය වලින් සිදු වන අවස්ථාවන්හිදී ඒවා නියාමනය කිරීමේ ආයතනික ක්‍රමවේදයක් හෝ නෛතික පිළිවෙලක් මේ ආශ්චර්යමත් ලංකාවේ නැත. එමෙන්ම ඒවා ප්‍රශ්න කිරීමේ සම්ප්‍රදායක් හෝ ප්‍රඥාවක් පුවත්පත් පාඨකයාටද නැත. එසේ නමුත් එවැනි වංචාවන්ට යලි යලිත් රැවටීමට ලක් වීමේ අවිචාරී බව පමණක් මෙවැනි පුවත්පත් වලින් පාඨකයාට ප්‍රදානය කොට ඇති බව අවසන් වශයෙන් දක්වා සිටිනු කැමැත්තෙමි.

ශ්‍රී ලංකා හේතුවාදී සංගමය

**226, සයිමන් දියෙස් මාවත,**
**මාදුපිටිය, පානදුර**

**දුර අංකය** 0727449599
**ඊ මේල්**
lanka.rationalist@gmail.com

**ඔබගේ නිර්මාණ අත්දැකීම් සංක්ෂිප්ත ව තාරක**
**වරාපිටිය බාරේ ඉහත ලිපිනයට යොමු කරන්න**